# සාමාන්‍ය සමය තිස්දෙවන සතිය

## සඳුදා

පළමුවන කියැවීම ප්‍රඥා 1: 1–7

සලමොන්ගේ ප්‍රඥාව පොතෙන් උපුටා ගත් පාඨයෙකි.

ප්‍රඥාව වනාහි අධ්‍යාත්මික වස්තුවකි.

මිහිපිට විනිසකරුවෙනි, දැහැමිකමට ප්‍රේම කරන්න. සමිඳුන් ගැන ඔබේ කල්පනා අවංක කමින් ප්‍රබෝධ වේවා! සිතින් එතුමන් සොයා යන්න. එතුමන් පරීක්ෂා නොකරන අයට එතුමන් හමුවන බැවින් එතුමන් කෙරෙහි විශ්වාසය තබන අයට එතුමාණෝ එළිදරව් වන සේක. එහෙත් ආත්මාර්ථකාමී අදහස් නිසා කෙනෙක් දෙවිඳුන්ගෙන් වෙන් වෙති. යමෙක් සව් බලැති තැනැන් වහන්සේ පරීක්ෂා කරන විට එතුමාණෝ ඒ අනුවණයන් වියවුල් කරන සේක. ප්‍රඥාව කපටියෙකු තුළට කිසිදාක ඇතුළු නොවේ. පවට ණය ගැති වූවෙකු තුළ ද එය නොවෙති යි, උපදෙස් දෙන ශුද්ධාත්මය රැවටීම් හෙළා දකිනු ඇත. සාහසික අරමුණුවලින් එය ඈත්ව සිටියි. දුෂ්ටකම මතුවන විට එය විස්මිත වෙයි. ප්‍රඥාව වනාහි අධ්‍යාත්මික වස්තුවකි. මිනිසාට මිතුරෙකි. දෙවිඳුන් යමෙකුගේ ඇතුළාන්තය දකින බැවින් ඔහුගේ හද සැබැවින් ම පරීක්ෂා කර බලා ඔහුගේ කතාවට සවන් දී දේවාපහසකාරයාගේ වචනවලට කමා නොවනු ඇත. සැබැවින් ම සමිඳුන් ආත්මයාණන් මුළු ලොව පූර්ණ කරනු ඇත.

මුළු ලොව සියල්ල ඒකාබද්ධ කරන එතුමාණෝ කියන ලද හැම වචනයක් ම දන්නා සේක.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 139: 1–10

පිළිතුර : සමිඳුනි, සදා මාර්ගයෙහි අප ගෙන ගිය මැනව.

ගීය :
සමිඳුනි, ඔබ මා සියුම් ලෙස විමසා බලා දැන ගත් සේක.
මාගේ ඉඳුම් හිටුම් සියල්ල ඔබ දන්න සේක.
දුර තියා ම මාගේ සිතුවිලි ඔබ තේරුම් ගන්න සේක.
මා ගමනක් ගියත්, නින්දට ගියත්, ඔබ මාගේ සියලු මාර්ග දන්න සේක.
මාගේ හැසිරීම සහමුලින් ම දන්න සේක.

මා මුවට වචනයක් එන්නටත් පෙර සමිඳුනි, එහි අග මුල ඔබ දන්න සේක.
පෙර පසු යන දෙපසින් ම ඔබ ඔබ මා වටකර ඇත.
ඔබේ අත මා රැකගනු ඇත. මෙම ඥානය මාගේ දැනුම ඉක්මවා යයි. උසස් ය.
මට ඊට ළඟාවිය නොහැකි ය.

ඔබෙන් සැඟවී මම කොතැනට යම් ද? ඔබ ඉදිරියෙන් කොතැනට පලා යම් ද?
මා ස්වර්ගයට නැගුනත්, ඔබ එහි ය. පාතාලයට බැස සැතපුණත්, ඔබ එහි ය.

මා නැගෙනහිරට ඉගිලී ගියත්, බටහිර මුහුදු සීමාන්තයේ විසුවත් එහිදීත්
ඔබේ අත මට මඟ පෙන්වන්නේ ය. ඔබේ දකුණත මට පිහිට වන්නේ ය.

සුපුවත් ජය නද පිලිප්පි 2: 16

ආලේලූයා! ආලේලූයා!
ඔබ ජීවන පණිවුඩය ප්‍රදානය කරමින්,
අඳුරු ලෝකයක දීප්තිමත් තාරකා මෙන් බබළන්න.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 17: 1-6

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"ඔබේ සහෝදරයා ඔබට විරුද්ධ ව සත්වරක් පව් කළත්,
ඔහු මනස්ථාපනය වේ නම්, ඔහුට කමාව දිය යුතුයි."

උන් වහන්සේ ශ්‍රාවකයන්ට කතා කරමින්, "මිනිසුන් පාපයට පමුණුවන හේතූන් ඇති වීම නියත ය. එහෙත් යමෙකු නිසා ඒ හේතු පැමිණේ ද, ඔහුට වන විපතක මහත! මේ කුඩා අයගෙන් කෙනෙකුගේ වැටීමට යමෙක් හේතු වනු ඇද්ද, ඔහුගේ ගෙල වටා ඇඹරුම් ගලක් එල්ලා මුහුදේ හෙළනු ලැබීම ඔහුට ඊට වඩා යහපති. පරිස්සම් වන්න. ඔබේ සහෝදරයා පව් කළොත් ඔහුට තරවටු කරන්න. ඔහු මනස්ථාපනය වේ නම් ඔහුට කමා වන්න. දවසකට සත් වරක් ඔබ වෙතට හැරී, "මම මනස්ථාපනය වෙමි' යි කීවොත්, ඒත් ඔහුට කමා වන්නැ" යි වදාළ සේක.

එවිට ශ්‍රාවකයෝ කතා කොට, "අපේ ශ්‍රද්ධාව වැඩිකළ මැනැව" යි ස්වාමීන් වහන්සේට කීහ. ස්වාමීන් වහන්සේ කතා කොට, "අබ ඇටයක් පමණ ශ්‍රද්ධාව ඇතිව, මේ ඇඹිල්ල ගහට, 'ඉදිරී ගොස්, මුහුදේ පැළවෙව'යි කියන්නහු නම්, එය ඔබට කීකරු වනු ඇතැ" යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේය.